අක්කරෙයිපත්තු මහා නගර සභාව - 2024

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

අක්කරෙයිපත්තු මහා නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරිය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට අක්කරෙයිපත්තු මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.6.1 (ඇ) හි සඳහන් නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය සඳහා මුද්දර ගාස්තු ආදායම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	ඉඩම් හා අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ යාවත්කාලීන නොකිරීමෙන් මූල්‍ය වර්ෂයට අදාල මුද්දර ගාස්තු වටිනාකම ගණනය කළ නොහැකි වූ බව.	සමාලෝචිත වර්ෂය සඳහා මුද්දර ගාස්තු සම්පූර්ණයෙන් ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගතයුතුය.
(ආ)	මහනගර සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි 24 ක් සහ වාහන 60ක වටිනාකම ප්‍රත්‍යාගණනය කර එහි තථ්‍ය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	ප්‍රවර්තන වර්ෂයේ ප්‍රත්‍යාගණනය කිරිමට පියවර ගෙන ඇති අතර මෙම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රත්‍යාගණිත වටිනාකම් අනාවරණය කරනු ලබන බව.	අදාළ වත්කම් ප්‍රත්‍යාගණනය කර තථ්‍ය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගතයුතුය.
(ඇ)	පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේ සභාවට පරිත්‍යාග කරන ලද උපකරණ සහ පොත් 303ක වටිනාකම එකතුව රු.639,032 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරිමේදී ඉහත දෝෂ නිවැරදි කරනු ලබන බව.	පරිත්‍යාග ලෙස ලැබෙන භාණ්ඩවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගතයුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ කපා හරින ලද පොත් 765 ක වටිනාකම ගණනය කර පොත්වල පිරිවැයෙන් ඉවත්කර නොතිබුණි.	-එම-	කපා හරින ලද පොත්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් අඩුකර දැක්වීමට පියවර ගතයුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්.

	නීතී, රීතී, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහා නගර සභා ආඥාපනත, (252 අධිකාරිය)			
	(i) 155 වගන්තිය	මහා නගර සභාවට අයත් කඩකාමර සඳහා කඩකුලී අයකිරීමේදී ප්‍රත්‍යාගණනය කර සුදුසු මුදලක් අයකිරීමට පියවර ගෙන නොතිබුණි.	නවීන පොදු වෙළඳපොළ, සාප්පු සංකීර්ණය සහ බස් නැවතුම්පොළ තුළ පිහිටා ඇති කඩකාමර කුලිය ප්‍රත්‍යාගණනය කරන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර ඇති අතර, එහි කටයුතු අවසන් වූ පසු කුලිය සංශෝධනය කිරීමට පියවර ගනු ලබන බව.	ආඥාපනත ප්‍රකාරව, කඩකාමර සඳහා අයකරනු ලබන වටිනාකම කාලානුරූපීව ප්‍රත්‍යාගණනය කිරීමට පියවර ගතයුතුය.
	(ii) 247 (ඇ) වගන්තිය	මහා නගර සභා බල ප්‍රදේශයේ සංවර්ධනය නොකරන ලද ඉඩම් හඳුනාගෙන එයට සුදුසු දේපළ බදු අය කිරීමට මහා නගර සභාව කටයුතු කර නොතිබුණි.	සංවර්ධනය නොකරන ලද ඉඩම් සම්බන්ධයෙන් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික වටිනාකම ගණනය කර ඒ අනුව සියයට 10ක දේපළ බදු අයකරනු ලැබේ. වාර්ෂික වටිනාකම ප්‍රත්‍යාගණනය කරන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර ඇති අතර, එහි කටයුතු අවසන් වූ පසු දේපළ බද්ද ප්‍රතිශෝධනය කිරීමට පියවර ගනු ලබන බව.	ආඥාපනත ප්‍රකාරව, සංවර්ධනය නොකරන ලද සියළු ඉඩම් හඳුනා ගැනීමටත් එහි වාර්ෂික වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තු වෙන් ලබාගෙන සුදුසු පරිදි දේපළ බදු අයකර ගැනීමට කිරීමට පියවර ගතයුතුය.
	(iii) 252 වගන්තිය	දේපළ බද්ද නොගෙවූ දේපළ හිමිකරුවන්ට එරෙහිව ලිඛිත දැනුම්දීමක් සිදුකර අයකලයුතු රු.74,096,948 ක	දේපළ බදු නොගෙවූ බදු ගෙවන්නන් වෙත රතු නිවේදන යවා ඇති අතර, ආඥාපනත ප්‍රකාරව, බදු අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව.	ආඥාපනත ප්‍රකාරව, අයවියයුතු හිඟමුදල කඩිනමින් අයකිරීමට අවශ්‍ය ක්‍රමවේදයන්

		මුදල අයකිරීමට හෝ දේපළ තහනම් කර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මහා නගර සභාව විසින් ගෙන නොතිබුණි.		අනුගමනය කළ යුතුය.
(ආ)	1971 අංක 48 දරන පළාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන	දේපල බදු අයකිරීම සඳහා මහා නගර සභා බලප්‍රදේශයේ පිහිටි නිශ්චල දේපළ වසර 05 කට වරක් තක්සේරු කිරීමට මහා නගර සභාව විසින් කටයුතු කර නොතිබුණි.	මහා නගර සභා බලප්‍රදේශයේ පිහිටි නිශ්චල දේපළ තක්සේරු කිරිමට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම සිදුකර ඇති අතර, එම ක්‍රියාවලිය අවසන් වූ පසු ප්‍රතිශෝධිත දේපල බද්ද අයකිරිමට කටයුතු කරන බව.	පනත ප්‍රකාරව, නිශ්චල දේපළ වර්ෂ 05කට වරක් තක්සේරු කිරීමට පියවර ගෙන නව තක්සේරුව මත බදු අය කළ යුතුය.
(ඇ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය	මහා නගර සභාවේ කාර්යසාධන පිළිබඳ වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	මූල්‍ය කාර්යසාධන ඇගයීමක් සකස් කර ඇති අතර, එසේම මහා නගර සභාව සඳහා කාර්යසාධන ඇගැයීම ප්‍රවර්තන වර්ෂය සඳහා සකස් කරන ලෙසට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව.	විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව, කාර්යසාධන වාර්තාව විගණනයට ඉදිරිපත් කිරිමට පියවර ගතයුතුය.
(ඈ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(1),(2),(3)	මහා නගර සභාවේ තැන්පතු ගිණුමේ පැවැති රු.1,743,656 ක්වූ වසර දෙකකට වැඩි කල් ඉකුත් වූ තැන්පතු අදාළ පුද්ගලයන්ට ලබාදීමට හෝ ආදායමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි.	ආපසු ගෙවිය හැකි තැන්පතු හඳුනාගෙන අදාල අයට ගෙවා ඇති අතර ඇතැම් තැන්පතු ආදායමට මාරු කර ඇත. තවදුරටත් පවතින ශේෂවලින් ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල මෙම අඩුපාඩු නිවැරදි කරන බව.	මුදල් රෙගුලාසි අනුව, කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග ඉතා කඩිනමින් සිදුකිරීමට පියවර ගත යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 13,545,820ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු. 32,126,681 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				**2023**			
	ආදායම් ප්‍රභවය	**ඇස්තමේන්තුගත ආදායම**	**බිල් කළ ආදායම**	**රැස්කළ ආදායම**	**දෙසැම්බර් 31 දිනට මුළු හිඟය**	**ඇස්තමේන්තුගත ආදායම**	**බිල් කළ ආදායම**	**රැස්කළ ආදායම**	**දෙසැම්බර් 31 දිනට මුළු හිඟය**
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(i)	වරිපනම් හා බදු	21,700,000	82,674,428	8,391,499	74,282,928	18,253,530	74,851,791	7,475,946	67,375,845
(ii)	කුලී	35,555,148	44,354,295	19,011,063	25,343,232	31,837,148	41,007,058	17,768,544	23,238,514
(iii)	බලපත්‍ර ගාස්තු	7,250,000	3,492,385	3,492,385	-	10,200,000	4,046,200	4,034,000	12,200
(iv)	වෙනත් ආදායම්	46,675,000	32,760,993	20,779,017	11,981,976	44,015,00	47,158,170	47,158,170	-
(v)	එකතුව	111,180,148	163,282,102	51,673,964	111,608,136	64,692,178	167,063,219	76,436,660	90,626,559

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණයන් පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය සඳහා දේපළ බදු ආදායම් ලෙස රු.18,500,000 ක් ඇස්තමේන්තුගත කර තිබූ නමුත්, එම ඇස්තමේන්තුගත ආදායමින් සියයට 16.5ක් හෙවත් රු.3,045,539ක් පමණක් අයකර තිබුණි. මේ අනුව අයවැයෙන් සියයට 83.5ක ආදායම එනම් රු.15,454,461ක් තවදුරටත් හිඟහිටිව පැවතුණි.	ආදායම් පරීක්ෂකවරුන්ගේ පුරප්පාඩු දීර්ඝ කාලයක සිට පැවැතීමෙන් ආදායම් අයකර ගැනිමෙහි විශාල පසුබෑමකට ලක්වී තිබෙන අතර, ඉදිරියේදී ආදායම් එකතුකිරීමේ නිලධාරීන් පත්කර හිඟමුදල් අයකර ගැනීමට පියවර ගන්නා බව.	ආදායම් එකතුකිරීමේ නිලධාරීන් පත්කර හිඟහිටි දේපළ බදු ආදායම් කඩිනමින් අයකර ගැනීමට පියවර ගත යුතුය.
(ආ)	කුලීහිමියන් 223කුගෙන් අයවිය යුතු රු.14,148,126ක් පසුගිය 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අයකිරීමට කටයුතු කර නොතිබුණි.	වර්තමානයේ හිඟ මුදල් අයකිරීමේ නිවේදන ලිපි නීතිඥයින් මාර්ගයෙන් සමථ මණ්ඩල වෙත යොමු කරමින් පවතී. තවද, ඉතිරිව පවතින හඳුනාගත නොහැකි හිඟහිටි අනාගතයේදී කපාහැරීමටද පියවර ගනු ලබන බව.	අයකර ගත යුතු හිඟමුදල් කඩිනමින් අයකර ගැනීමට පියවර ගතයුතුය.

(ඇ)	සභාවේ වත්කම් බදු දීමෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ලැබිය යුතු රු.9,921,530ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	1992 සිට 2011 දක්වා කාලපරිච්ඡේදය දක්වා වූ හිඟහිටි මුදල් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් අක්කරෙයිපත්තු මහා නගර සභාවට පවරා තිබුණි. මේ හේතුවෙන් එම ලැබිය යුතු මුදල් සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු නොමැති වීමෙන් ඒවා කපා හැරීමට පියවර ගෙන තිබූ බව.	අයකර ගත යුතු හිඟහිටි ආදායම් කඩිනමින් අයකර ගැනීමට හෝ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගතයුතුය.
(ඈ)	ඉඩම් ගනුදෙනු මත මුද්දර ගාස්තු ප්‍රතිපූර්ණය කිරීම් ඉල්ලුම් කිරීමේ අයදුම් පත් රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයාට යැවිය යුතු වුවත්, 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාස වෙනුවෙන් මුද්දර ගාස්තු නියමිත කාල වකවානු තුළ ඉල්ලීම් කර ලබාගැනීමට මහා නගර සභාව විසින් පියවර ගෙන නොතිබුණි.	2023 වර්ෂයට නියමිත මුද්දර ගාස්තු 2025 අප්‍රේල් මාසයේ ලැබී තිබුණි. 2024 වර්ෂයට අදාල මුද්දර ගාස්තුවලින් ජනවාරි හා පෙබරවාරි මාසවලට අදාල ලිපි ලේඛන පමණක් ලබාදී ඇති අතර ඒවා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලබාදී ගෙවීම් සඳහා ඉදිරිපත් කර ඇති බව.	මුද්දර ගාස්තු නියමිත කාල වකවානු තුළ ගණනය කර අයකර ගැනීමට පියවර ගතයුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

මහා නගර සභා ආඥාපනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 06ක් සඳහා 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය ප්‍රකාරව, ඉන්ධන දහනය පිළිබඳ වාර්තාවක් ලබා නොගැනීමෙන් එම වාහනවල ඉන්ධන සඳහා ගෙවා තිබූ රු.3,678,035කින් සත්‍ය වශයෙන් ධාවනය කළ දුර ප්‍රමාණය විගණනයේදී සනාථ කරගත නොහැකි විය.	සභාවේ සියළු වාහනවල ඉන්ධන දහන පරීක්ෂා කිරීමට නැගෙනහිර පළාත් යාන්ත්‍රික ඉංජිනේරුවරයාට දැනුම්දී තිබූ නමුත්, නියමිත කාලයේදී සම්පූර්ණ කළ නොහැකි විය. වර්තමානයේ ඉන්ධන දහන පරීක්ෂාව කිරීමට පියවර ගෙන ඇති බව.	චක්‍රලේඛය ප්‍රකාරව, සියළුම වාහන සඳහා ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකළ යුතුය.

(ආ)	මිලදී ගත් ටයර් ප්‍රතිස්ථාපනය කිරීමේදී, අදාල වාහනයේ දැනටමත් භාවිතා කර ඇති ටයර්වල කිලෝමීටර් ගණන, මාරුකරන ලද ටයර්වල අපේක්ෂිත කිලෝමීටර් ගණන සටහන් කර භාර ගැනීම හා භාරදීම සිදුනොවූ බැවින්, මිලදී ගෙන භාවිතා කරනු ලබන ටයර්වල සත්‍ය වශයෙන් ධාවනය කළ කිලෝමීටර් ගණන තහවුරු කිරීමට නොහැකි විය	ඔබ විසින් අනාවරණය කළ කරුණු ඇතුළත් වන අයුරින් ලේඛනගත කිරීමට පියවර ගෙන ඇති බව.	වාහනවල ටයර් සහ අමතර කොටස් මාරුකිරීමේදී සටහන් කිරීම සෑම වාහනයක් සඳහාම ලොග් සටහන් පොතක් පවත්වාගෙන යාමට පියවර ගතයුතුය.
(ඇ)	2011 වර්ෂයේ අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ සේවකයෙකුට සහ ප්‍රජා ශාලා මධ්‍යස්ථානයකටත් ලබාදුන් බවට මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර තිබූ රු.106,003 ක අත්තිකාරම් 02 ක් වර්ෂ 13ක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම ශේෂයන් කපා හැරීමේ මූලික ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	අත්තිකාරම් ලෙස ගෙවූ මුදල අයකර ගැනීමට හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය.
(ඈ)	1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් සහ 1980 වර්ෂයේ සේවක භාරකාර අරමුදල් පනත් ප්‍රකාරව, අරමුදල් සඳහා දායක මුදල් සෑම මාසයකම ගෙවිය යුතු වුවත්, සේවක වැටුපෙන් අඩුකළ සේවක අර්ථසාධක දායක මුදල් රු.285,600ක් සහ සේවක භාරකාර දායක මුදල් රු.26,930ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නොගෙවා ආපසු ගෙවිය යුතු තැන්පතු ලෙස දක්වා තිබුණි.	ප්‍රවර්තන වර්ෂයේදී අදාල ආයතන වෙත යැවීමට කටයුතු යොදා ඇති බව.	අදාළ පනත් වල විධි විධාන ප්‍රකාරව දායක මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය.
(ඉ)	ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ 2017 වසරේ මහා නගර සභාවට ලැබී තිබුණු විද්‍යුත් ප්‍රචාරක රූපවාහිනිය මගින් වාර්ෂිකව ආසන්න වශයෙන් රු.350,000 ක ආදායමක් ලැබී තිබුණද, 2019 වසරේ අක්‍රියවී පැවති මෙය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අළුත්වැඩියා කිරීමට කටයුතු නොකිරීමෙන් පසුගිය වර්ෂ 06ක සිට ආදායම් අහිමි වී තිබුණි.	ප්‍රවර්ථන වර්ෂයේ අළුත්වැඩියා කිරීමට කටයුතු කරන බව.	විද්‍යුත් ප්‍රචාරක රූපවාහිනිය දීර්ඝකාලයක සිට අක්‍රිය වී පවතින බැවින් අප්‍රමාදව අළුත්වැඩියා කර ආදායම් ඉපැයීමට කටයුතු කළ යුතුය.
(ඊ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් අවසාන දක්වා සේවකයින්ගේ හිඟ විශ්‍රාම වැටුප්	හිඟ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් අක්කරෙයිපත්තු මහා නගර	සභාවන් දෙකම එක්ව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සමග

රු.1,643,139ක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට නොගෙවීම හා දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය මුදලින් තවදුරටත් නොගෙවා තිබූ රු.643,961ක් සම්බන්ධයෙන් සාකච්ඡා කර එහි නිවැරදිතාව පරීක්ෂා කර එම මුදල් ගෙවීම සම්බන්ධයෙන් නිවැරදි තීරණයක් ගෙන නොතිබුණි.	සභාව හා අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ ප්‍රමාණවත් තොරතුරු නොමැති වීමෙන් හිඟමුදල් සම්බන්ධයෙන් නිවැරදි තීරණයක් ගත නොහැකි වී ඇති බව.	සාකච්ඡා කර මෙම මුදල ගෙවීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහා නගර සභා ආඥාපනත ප්‍රකාරව, කඩකුලී වටිනාකම කාලීනව තක්සේරු කිරීමකින් තොරව 2021 වර්ෂයෙන් පසු 2023 වර්ෂයේ කුලී වටිනාකමෙහි සියයට 10ක වැඩි කිරීමක් සිදුකර තිබුණි. එසේ වුවත්, එම ප්‍රදේශයේ ක්‍රියාත්මකව පවතින කුලි වටිනාකමට වඩා අඩු ප්‍රමාණයකින් එනම් මාසිකව රු.2,000 සිට රු.5,000ක් දක්වා පරාසයකින් කුලිය තීරණය කර තිබුණි. එමගින් මහා නගර සභාවට හිමි ආදායම් වාර්ෂිකව අහිමි වෙමින් පැවැති අතර සභාවේ සියළුම කඩකාමරවල කඩකුලී වටිනාකම වර්තමාන කුලී ප්‍රමාණයන්ට සරිලන පරිදි තීරණය කිරීමට පියවර ගෙන නොතිබුණි.	තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති අතර එම දෙපාර්තමේන්තුවේ කටයුතු අවසන් වීමෙන් පසුව කඩකුලී ප්‍රතිශෝධනය කිරීමට පියවර ගනු ලබන බව.	ඉතා කඩිනමින් කඩකුලී තක්සේරුව සිදුකර මහා නගර සභාවේ ආදායම් ඉහළ නංවා ගැනීමට පියවර ගතයුතුය.
(ආ)	මහා නගර සභාව විසින් දේපළ කාලීනව තක්සේරු කිරීමටත්, දේපළ හිමියන්ගේ දත්ත යාවත්කාලීන කිරීමටත් ක්‍රියාමාර්ග ගෙන නොමැති වීමෙන් පසුගිය වර්ෂයේ රු.67,375,845ක්ව පැවැති හිඟහිටි ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයේ රු.74,096,948ක් ලෙස වැඩිවී තිබුණි. ඒ අනුව මහානගර සභාවේ දේපළ බදු රැස්කිරීමෙහි දැඩි අකාර්යක්ෂමතාවයක් පැවතුණි.	තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති අතර එම දෙපාර්තමේන්තුවේ කටයුතු අවසන් වීමෙන් පසුව ප්‍රතිශෝධිත දේපළ බදු අයකිරීමට පියවර ගනු ලබන බව.	ඉතා කඩිනමින් දේපළ වටිනාකම තක්සේරු කිරීමටත්, විධිමත්ව දේපළහිමියන්ගේ ලේඛන පවත්වා ගෙන යාමටත්, අදාල හිඟහිටි ශේෂයන් කඩිනමින් අයකර ගැනීමටත් පියවර ගතයුතුය.

3.3 නිෂ්කාර්ය වත්කම්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2011 සිට සමාලෝචිත වර්ෂය දක්වා මහානගර සභාවේ මාළු වෙළෙඳ පොල කඩකාමර, නව	කඩකාමර 115ක් සඳහාම ප්‍රසිද්ධ ලංසු කැඳවීම් කර තිබූ නමුත්, මෙම කඩකාමර	අදාල අනුමැතීන් ලබාගෙන වෙනස්කම් සිදුකිරිමෙන් පසු සියළුම කඩකාමර කුලියට

වෙළෙපොල කඩකාමර, බස්නැවතුම්පල කඩකාමර, මහා නගර සභා උද්‍යාන කඩකාමර සහ බහාළුම් කඩකාමර ඇතුළුව කඩකාමර 115ක් නිෂ්කාර්යව පැවැති අතර ඒවා සුදුසු පරිදි හෝ ජනතාවගේ අවශ්‍යතාවයට අනුව වෙනස්කම් සිදුකර කුලියට ලබාදීමට මහා නගර සභාව විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ලබාගැනීමට කිසිදු ව්‍යාපාරිකයෙක් ඉදිරිපත් නොවූහ. මේ හේතුවෙන් ජනතාවගේ අවශ්‍යතාවයට අනුකූලව වෙනස්කම් සිදුකර කුලියට ලබාදීමට පියවර ගනු ලබන බව.	ලබාදීමට පියවර ගතයුතුය.

3.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභාව සතු නිශ්චල හා චංචල දේපළ ස්ථාවර වත්කම් ලේඛනයේ හා අනෙකුත් ස්ථාවර වත්කම් ලේඛනවල සම්පූර්ණයෙන් ලේඛනගත කිරීමට පියවර ගෙන නොතිබුණි.	විධිමත් අයුරින් ලේඛනගත කිරීමට විෂයභාර නිලධාරිට උපදෙස් ලබාදී එය ක්‍රියාත්මක කිරීමටත් පියවර ගෙන ඇති බව.	වත්කම්වල පිරිවැය නියමිත ලේඛන වල ලේඛනගත කිරීමට පියවර ගතුයුතුය.
(ආ)	සභාවට බාහිර පාර්ශවයන්ගෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබූ භාණ්ඩ ලේඛනගත කිරීමට පරිත්‍යාග ලේඛනය සභාව විසින් නඩත්තු කර නොතිබුණි. මෙමගින් සභාවට මේ දක්වා ලැබී තිබූ පරිත්‍යාග භාණ්ඩ පිළිබඳව විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි වී තිබුණි.	පරිත්‍යාග ලේඛනයක් සකස් කර පරිත්‍යාග ලැබීම් ඇතුළත් කිරීමට පියවර ගනු ලබන බව.	විධිමත්ව පරිත්‍යාග ලේඛනය පවත්වාගෙන යාමට පියවර ගත යුතුය.
(ඇ)	2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වාහන, ට්‍රැක්ටර් හා ට්‍රේලර් 17ක් අළුත්වැඩියා කර භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. මෙමගින් ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම් හා වාහන කුලී ආදායම් සභාවට අහිමි වී තිබුණි.	අළුත්වැඩියා කළ නොහැකි ට්‍රැක්ටර් හා ට්‍රේලර් අනුමැතිය ලබාගෙන වෙන්දේසි කිරීමටත්, අනෙක් වාහන එකින් එක අළුත්වැඩියා කරමින් පවතින බව.	වාහන අළුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට කටයුතු කළ යුතුය.
(ඈ)	2022 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයෙන් ජල සම්බන්ධතා ලබා ගැනීම සඳහා සභාවේ මාර්ග කැපීම සඳහා ප්‍රතිලාභීන් 135 ගෙන් මහා නගර සභාව විසින් රු.1,103,273 ක් තැන්පතු ලෙස ලබාගෙන තිබූ නමුත් එම මාර්ග යථා තත්ත්වයට පත් කර මාර්ගය ආරක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි.	තැන්පත් මුදල් යොදවා යථා තත්ත්වයට සකස් නොකළ මාර්ග පිළිසකර කිරීමට පියවර ගන්නා බව.	පලුදු කළ මාර්ග යථා තත්ත්වයට පත් කර මාර්ග ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතුය.

(ඉ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිරීක්ෂණ හා නිර්දේශ ක්‍රියාත්මක කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.	ප්‍රවර්තන වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති බව.	පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ ක්‍රියාත්මක කළයුතු අතර, සෑම වර්ෂයකම භාණ්ඩ සමීක්ෂණය නියමිත කාලවකවානු තුළ අවසන් කර එම වාර්තාවේ පිටපතක් විගණනයට ඉදිරිපත් කළ යුතුය.

3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන චක්‍රලේඛය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම සකස් නොකර මහා නගර සභාව විසින් සැපයුම් හා සේවා සහ මූලධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තු කිරීම සඳහා රු. 31,549,148ක් වැයකර තිබුණි.	ප්‍රවර්තන වර්ෂය සඳහා අවශ්‍යතා ලැයිස්තුව සකස් කර සම්පූර්ණ ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇති බව.	සෑම වර්ෂයක් සඳහාම ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර එයට අනුකූලව ප්‍රසම්පාදන ක්‍රියාවලීන් සිදුකිරීමට පියවර ගතයුතුය.

3.6 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
මහා නගර සභාවේ මාණ්ඩලික තනතුරු 05 ක පුරප්පාඩු නොපිරවීම සහ මූල්‍ය, පරිපාලන, සෞඛ්‍ය සේවකයින් සහ කම්කරු ආදි පුරප්පාඩු නොපිරවීම කිරීම හේතුවෙන් මහජන සෞඛ්‍ය සේවාවන්හි අධීක්ෂණය සහ ක්‍රියාකාරිත්වය අකාර්යක්ෂම වී තිබූ බව නිරීක්ෂණය විය.	පළාත් පාලන කොමසාරිස්වරයා සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) වෙත ඇතැම් තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා මහ නගර සභාව විසින් වරින් වර ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව.	සේවක මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කරගෙන මහා නගර සභාවේ කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීමට පියවර ගත යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපිත කර එමගින් ආයතන මෙහෙයුම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය සහ	අභ්‍යන්තර විගණන කමිටුවක් ප්‍රවර්තන වර්ෂය වෙනුවෙන් ස්ථාපිත කර ඇති බව සහ අභ්‍යන්තර විගණන සැලැස්මක් ද සකස් කර ඇති	සභාවේ කටයුතු විධිමත්ව අභ්‍යන්තර විගණනයකට ලක්කර සභාවේ මෙහෙයුම් ප්‍රවර්ධනය කිරිම

කාර්යාසාධනය ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	බව.	සඳහාත් කාර්යාසාධනය ඉහළ නැංවීම සඳහාත් නිර්දේශ සකස්කළ යුතුය.

4.2 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසාර සංවර්ධන අරමුණු හඳුනා ගැනීමටත්, මැනීම සඳහා දර්ශක ස්ථාපිත කිරීමටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය සැලැස්මේ තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සලසාගෙන නොතිබුණි.	මෙම වැඩසටහන කාර්යක්ෂමව සිදුකිරිමට නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇති අතර ඉදිරි වර්ෂයට අයවැය සකස් කිරීමේදී තිරසාර සංවර්ධන සැලැස්මට අයවැයෙන් මූල්‍ය ප්‍රතිපාදන සලසන බව.	චක්‍රලේඛ ප්‍රකාරව ඉලක්ක සපුරා ගත හැකි වන පරිදි දර්ශක ස්ථාපිත කර අයවැයෙන් ප්‍රතිපාදන සලසා ගැනීමට පියවර ගත යුතුය.

4.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ මහා නගර සභා බලප්‍රදේශයේ රැස්කළ කසල ටොන් 4,005ක් අඩංගු වූ ඝන අපද්‍රව්‍ය එකතු කිරීමේ මධ්‍යස්ථානයට බැහැර කර රු.1,201,389ක් ගෙවා තිබුණි. තවද, මහා නගර සභාව කසල වර්ගීකරණය කිරීමට පියවර නොගැනීමෙන් රැස්කළ සියළු කසල නොදිරන කසල සේ සළකා, කසල ටොන් එකක් සඳහා වැඩිපුර රු.100ක් ගෙවා තිබුණු අතර වාහන ඉන්ධන වියදම්ද දරා තිබුණි.	මහා නගර සභාව විසින් කසල වර්ගීකරණය කර ලබාදෙන ලෙසට දැනුවත් කිරීම් සිදුකර ඒ සඳහා වර්ණ දෙකකින් මළු ලබාදී තිබූ නමුත්, ජනතාවගේ සහයෝගය නොමැතිවීම හා සෞඛ්‍ය කම්කරුවන්ගේ හිඟය හේතුවෙන් කසල වෙන්කර ලබා නොගනී. ඉදිරියේදි වර්ග කර ලබාගැනීමට පියවර ගනු ලබන බව.	කසල නිසි ලෙස වෙන් කර ලබාගැනීමටත්, කාබනික පොහොර නිෂ්පාදනය කිරීමටත්, වියදම් අවම කිරීමටත් කටයුතු කළ යුතුය.

4.4 පාරිසරික ගැටළු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මහා නගර සභාව භාවිතා කරන ඝන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථානය සහ ඝාතකාගාරය සඳහා ජාතික පාරිසරික පනත සහ එහි රෙගුලාසිවලට අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පරිසර බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ප්‍රවර්ථන වර්ෂයේ දී පරිසර බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරන බව.	පාරිසරික බලපත්‍ර ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතුය.